**Gampaha Wickramarachchi University of Indigenous Medicine, Sri Lanka**

**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව**

**පුරප්පාඩු**

**විවෘත අයදුම්පත් කැඳවීම -2026**

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, රියදුරු තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අයදුම්පත් යොමු කිරීම සඳහා උපදෙස්**

1. අයදුම්පත් **මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පමණක්** ඉදිරිපත් කළ යුතු අතර අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා මාර්ගගත පෝරමය **gwu.ac.lk** වෙබ් අඩවියේ **vacancies** යටතේ ඉදිරිපත් කර ඇත. **මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි දෘඪ පිටපතක්,** බාගත කර **(Download)** **අයදුම්කරු විසින් අත්සන් කොට 2026.10.02** වන දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් **සහකාර ලේඛකාධිකාරි, ආයතන අනධ්‍යන අංශය, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, නුවර පාර, යක්කල** යන ලිපිනයට එවීමට පියවර ගත යුතුය.

2. අයදුම්කරුවන් විසින් නැවත නොගෙවනු ලබන රු. **750/-** ක අයදුම්පත් හා විභාග ගාස්තුවක් ගෙවිය යුතුය. එය ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය නමින් මහජන බැංකුව, යක්කල ශාඛාවේ **333-1001-1-0000059** ගිණුම් අංකයට බැර කොට, අදාල රිසිට්පතෙහි මෘදු පිටපත මාර්ගගත ක්‍රමවේදයේ දක්වා ඇති පරිදි PDF ලෙස උඩුගත **(upload)** කළ යුතු වේ. එහි මුල් පිටපත අයදුම්පත සමඟ එවීම අනිවාර්ය වේ.

3. අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලි වීම, සුදුසුකම් සනාථ කිරීමට අදාළ සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා නොතිබීම ( එම ඡායා පිටපත් ග්‍රාම නිලධාරි, සාම විනිසුරු හෝ රජයේ මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කර තිබීම අනිවාර්යය වේ), මුදල් ගෙවූ ලදුපත අමුණා නොතිබීම සහ අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ නැවත සලකා බලනු නොලැබේ.

4. මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා වූ පෝරමය **2026.09.11 දින සිට 2026.10.02** දින දක්වා විවෘතව පවතිනු ඇත. තාක්ෂණික ගැටළු හෝ විමසීම් වේ නම් 033 2222748 හෝ 033 2215829 දුරකථන අංකවලට ( රාජකාරි දිනවල පෙ.ව 9.00 – ප.ව. 4.00) ඇමතිය හැකිය.

5. අයදුම්පත්‍රය බහාලන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර පැහැදිලිව සඳහන් කිරීම අත්‍යාවශ්‍ය වේ. සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි පිටපත විද්‍යුත් තැපැල හරහා එවනු ලබන නිසා අයදුම්කරුවන් තමන්ගේ විද්‍යුත් තැපැල් ලිපිනය භාවිතා කිරීම අනිවාර්ය වේ. (මාර්ගගත පෝරමයට ප්‍රවේශ වීම සඳහා ලබා දී ඇති විද්‍යුත් තැපැල ඔබ සමඟ සන්නිවේදනය කිරීමට භාවිතා කරනු ඇත)

**1. <u>රියදුරු (III ශ්‍රේණිය)</u>**

**අවශ්‍ය සුදුසුකම් :**

a). අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06 කින් සමත් වීම සහ සම්මාන සාමාර්ථ 02 ක් තිබිය යුතුවේ.

සහ

b). මෝටර් රථ කොමසාරිස් ජෙනරාල් විසින් නිකුත් කරන ලද බර වාහන සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම සහ එම බලපත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර (03) රියදුරු පළපුරුද්දක් තිබීම.

**වයස :** අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය: U-PL 3 (III) රු.48,005 – 16x490 – 55,845 (මාසික)**

- මීට අමතරව ජීවන වියදම් දීමනාව (රු. 17,800/-) ඇතුළුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අනෙකුත් අමතර දීමනා ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

සියළුම අයදුම්කරුවන්,

(i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(ii) තනතුරේ රාජකාරි හොඳින් ඉටුකිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
(iii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

බී.ඒ.එන්.ක්‍රිෂාන්ත
ලේඛකාධිකාරි
2026.09.11

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED